# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1808/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 05/12/2024 පැය 1200

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.12.04 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 51 | 500 | තඹ දඟර 01<br>ගෑස් ලිප් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.12.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාලඹේ පොලිස් වසමේ මාලඹේ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් **13** මිලිග්‍රෑම් **320** ක් හා එම ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන ලද මුදල් රුපියල් **436770/=** ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාලඹේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මාලඹේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.12.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මුල්ලේරියාව පොලිස් වසමේ මුල්ලේරියාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 70ක්, එම ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 3500,000/= ක් හා මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදා ගත් ත්‍රීරෝද රථයද සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර**

2024.12.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඌරගස්මංහන්දිය පොලිස් වසමේ ලේනගම පලාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 02 ග්‍රෑම් 600 ක් සමඟ සැකකරුවෙකු ඌරගස්මංහන්දිය** පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 40 ක් වූ ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීති විරෝධි තහනම් තංගුස් දැල් සමඟ සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.12.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මුතූර් පොලිස් වසමේ හබීබ්නගර් ප්‍රදේශයේදී වැටලීමක් 03 ක් සිදුකර **නීති විරෝධි තහනම් දැල් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ධීවර කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25,30 හා 46 වයස් වල පසුවන මුතූර් ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**